උතුරු හා නැගෙනහිර ජල සම්පාදන සනීපාරක්ෂක සෞඛ්‍ය හා ආරක්ෂණ ව්‍යාපෘතියේ (වොෂ්) 2014
------------------------------------------------------------------------------------------------------------------------

උතුරු හා නැගෙනහිර ජල සම්පාදන, සනීපාරක්ෂක, සෞඛ්‍ය හා ආරක්ෂණ ව්‍යාපෘතියේ (වොෂ්) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනය අතර, 2011 නොවැම්බර් මස එළඹි අංක ටීඑෆ් 10773 දරන ප්‍රදාන ගිවිසුමේ 2.06 (ඇ) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අවසානයේ දී ආදර්ශ සහ සනීපාරක්ෂණ පුරුදුවල හා නැවත පදිංචි වන ප්‍රජාවන්ගේ ජීවිතවල සමස්ථ ගුණත්වය වැඩි දියුණුව පිනිස දායකවීමට ආදර්ශ අනුරූ ඇති කිරීම, දේශීය මට්ටමේ ජලය, සෞඛ්‍ය ආරක්ෂණ හා සනීපාරක්ෂණ සේවා ලබා දීමට ආයතනික පද්ධති සවිබල ගැන්වීම වෙනුවෙන් සජීවී යාන්ත්‍රනයකට මඟ පෙන්වීම, ඇතුළුව යුද්ධයෙන් පසු නිවාස යලි ඉදිකිරීමේ මැදිහත් වීමේ අනුග්‍රහය වෙනුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල දිස්ත්‍රික්ක දෙකක් තුළ තෝරා ගත් ග්‍රාමීය ප්‍රජාවේ සුරක්ෂිත හා අඛන්ඩ නල ජල සැපයුම පරිශීලනය සහ සෞඛ්‍ය ආරක්ෂණය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 220 කට සමාන එජඩො මිලියන 2.01 ක් ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනය විසින් ලබා දීමට එකඟ වී ඇත. තවද, ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 40 ක් වෙන්කිරීමට 2011 ඔක්තොබර් 06 දින පැවති රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 නොවැම්බර් ආරම්භ කළ අතර 2014 ජුනි 30 අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් ව්‍යාපෘති කාලය 2014 ඔක්තොබර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට ඇතුළත්ව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම
-----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
---------------

2.1 මතය
---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා

කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය තුළ ගෙවන ලද එකතු කළ අගය මත බදු (වැට්) රු. 26,348,251 ක් කෙරීගෙන යන වැඩවලට ඇතුළත් නොකර ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වයට එරෙහිව හිලව්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශ්‍රී ලංකා රජයේ දායකත්වය හා කෙරීගෙන යන වැඩවල අගය යන දෙකම එම වටිනාකම් වලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මන්නාරමේ ඉඩමක් මැණුම් කිරීම සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ග්‍රාමීය ජල ඒකකයේ කාර්යාලය බෙදා වෙන් කිරීම වෙනුවෙන් දරන ලද පිරිවැය එකතුව රු. 670,691 ක් වැරදි ලෙස ගෘහ භාණ්ඩ හා උපකරණ පිරිවැය ලෙස දක්වා තිබුණි.

2.2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

------------------------------------------------

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය සහ 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) හී ඡේද අංක 05 අනුව, විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත එකතුව රු. 4,405,631 ක එකතු කළ අගය මත බදු ගෙවීම් මත මාසික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1987 අංක 03 දරන පොදු පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් බාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩර් ගිවිසුම දින සිට දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් තෝරා ගත් කොන්ත්‍රාත්කරුවන් විසින් එම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ණය දෙන නියෝජිතායතනය | 2.01 | 220 | 80 | 0.47 | 61.44 | 2.01 | 259.27 |
| ශ්‍රී.ලං.ර | - | 40 | 27 | 0.24 | 26.99 | 0.45 | 59.00 |
| එකතුව | 2.01 | 260 | 107 | 0.71 | 88.43 | 2.46 | 318.27 |

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්තුමය වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක උද්දීපනය කරමින් සමස්ථ ව්‍යාපෘති කාලය ආවරණය වන විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර තිබුණ ද ක්‍රියාකාරි සැලැස්ම සමඟ සැසඳීමෙන් ව්‍යාපෘතියේ කාර්යසාධනය සමාලෝචනය සඳහා ප්‍රගති වාර්තා සකස් කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම්වල සටහන් තබා ගැනීම ආදී නිශ්චිත යාන්ත්‍රනයක් ඇතිකර නොතිබුණි.

(ආ) මන්නාරම හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක වල සෞඛ්‍ය ආරක්ෂණ හා සනීපාරක්ෂණ සේවා සැපයීමේ සංරචකය යටතේ ව්‍යාපෘතියේ මෙහෙයුම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘති කාලය තුළ මන්නාරම හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ගම් 12 ක ගෘහස්ථ වැසිකිළි ඒකක 900 ක් වැඩිදියුණු කිරීම අරමුණ විය. කෙසේ වුවත් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ග්‍රාමීය ජල සැපයුම් අංශය විසින් පිළියෙල කරන ලද සනීපාරක්ෂක වැඩසටහන අනුව වැසිකිළි 800 ක් පමණක් වැඩිදියුණු කිරීමට සැලසුම්කර තිබූ අතර මන්නාරම්

දිස්ත්‍රිකයේ කඩ්ඩුකිරන්කුදුඉරිප්පු ගම්මානයේ ප්‍රතිලාභීන් ඉල්ලීම් නොකළ බැවින් එයින් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, ඇස්තමේන්තු කළ නිවාස වැසිකිලි ඒකක 606 න් ව්‍යාපෘතිය විසින් 2014 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිවාස වැසිකිලි ඒකක 517 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.මන්නාරම දිස්ත්‍රික්කයට අදාලව සිදු කළ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සඳහා විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) එසේම ව්‍යාපෘති කාලය අවසන් වන විටත් ව්‍යාපෘතිය විසින් දැනුවත් කිරිමේ වැඩසටහන් නියමිත පරිදි පවත්වා නොතිබුණි.

(ඇ) මන්නාරම හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක වල සුරක්ෂිත හා කල්පවත්නා නලජල සැපයුමකට ප්‍රවේශයන් වැඩිකිරීමේ සංරචකය යටතේ ව්‍යාපෘතියේ මෙහෙයුම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) මන්නාරම හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක වල පවුල් 3000 කට සුරක්ෂිත පානීය ජලය සැපයීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ ඉලක්කය පසුව පවුල් 2480 කට සංශෝධනය කර තිබුණි. තවද ජල සැපයුම් යෝජනා ක්‍රම සම්පූර්ණ කිරීම දින 65 සිට 133 දක්වා කාල පරාස තුළ ප්‍රමාදයන් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, මන්නාරම් දිස්ත්‍රික්කයේ ගම්මාන 10 ක පවුල් 1339 ක් සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගම්මාන 07 ක පවුල් 1149 ක් ඔවුන්ගේ නිවාස වලට වතුර මීටර හා නල ජල සැපයුම් මිලදී ගැනීමට ඉල්ලීම් කර තිබුණි. ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව, මන්නාරම් දිස්ත්‍රික්කයේ ගැමියන් විසින් වතුර මීටර 1188 ක් මිලදී ගෙන තිබුණු අතර, 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් නල ජල සම්බන්ධතා 1039 ක් ලබා දී තිබුණි. එසේම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගැමියන් විසින් වතුර මීටර 1126 ක් මිලදී ගෙන තිබු අතර, එදිනට ව්‍යාපෘතිය විසින් නල ජල සම්බන්ධතා 906 ක් ලබා දී තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්දේසි රහිත බැංකු බැඳුම්කරයක් මත අඩු පාඩු නිවැරදි කිරිමේ වගකීම් කාලය අවසන් විමට පෙර කොන්ත්‍රාත්කරුවකු වෙත වටිනාකම රු. 1,598,554 ක රඳවා ගැනීම් මුදල් ව්‍යාපෘතිය නිදහස්කර තිබුණි.

(ආ) ගැඹුරු ළිං 2 ක් ඉදි කිරීම සඳහා භූමි සකස් කිරිමේ දී ගල් හාරා ඉවත් කිරීමට රු. 1, 912,876 ක් විචලතා නියෝගයක් යටතේ සිදුකර තිබුණු බවත්, එමඟින් ලද ද්‍රව්‍ය වර්ග මීටර 208.15 ක ගල්

ආර්ථිකමය ඵලදායී කාර්යයකට භාවිතා නොකර වැඩ බිමේ ගොඩ ගසා තිබුණු බවත්, නිරීක්ෂණය විය.

3.4 වෙනත් අරමුණු සඳහා ව්‍යාපෘති අරමුදල් භාවිතා කිරීම
---------------------------------------------------------------

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සඳහා වායු සමීකරණ 2 ක් ප්‍රසම්පාදනය සඳහා ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන අරමුදල් වලින් රු. 162,255 ක් වියදම් කර තිබුණි.

3.5 මූල්‍ය පාලනයේ අඩුපාඩු
----------------------------

මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජුලි 20 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 ට අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් විගණනය කර නොතිබුණි.